**ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන**

# Human Resource Development Programme to take Sri Lankan Schools to 21st Century Education

**සැසිය 9 (Session 9)**

**පුනරීක්ෂණය හා විදුහල්පති සංවර්ධනය ඉලක්ක කර හඳුන්වා දී තිබෙන ප්‍රමිති පාදක විෂයමාලා**

**පුනරීක්ෂණය**

1. ‘වෂර් 2015’ යන්න සඳහන් කරන විට ඔබේ මතකයට නැඟෙන ශ්‍රී ලාංකිය පාසල් විෂයමාලා හා සම්බන්ධ සිද්ධි මොනවා ද?
   - **නව සහස්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය** සඳහා වෙන් කරන ලද 2007-2014 කාලය අවසන් ව ඇති නිසා **ඊළඟ පාසල් විෂයමාලා චක්‍රය** ආරම්භ කළ යුතු වෂර්ය උදා වී ඇති බව
   - මෙම චක්‍රය, ශ්‍රී ලාංකිය පාසල් විෂයමාලා හා සම්බන්ධ **තෙවන විෂයමාලා චක්‍රය** බව
2. වෂර් 2015 වන විට ලොව පුරා රටවල **දෙවන වතාවට** ජනප්‍රිය වෙමින් පැවති **ප්‍රමිති පාදක විෂයමාලා ප්‍රවේශය** ශ්‍රී ලාංකිය සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය යොදා ගත්තේ කෙසේ ද?
   - **පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව** (School Quality Assurance–SQA) ඉලක්ක කර, වෂර් 2015 දී **ප්‍රමිති පාදක වැඩසටහනක්** හඳුන්වා දීමට
   - වෂර් 2018 වන විට සම්පාදනය කර තිබුණ **පාසල් නායකත්වය හා කළමනාකරණය සඳහා වූ ජාතික නිපුණතා රාමුව** (National Competency Framework for School Leadership and Management) පදනම් කර ගනිමින් විදුහල්පති සංවර්ධනය සඳහා **මූලික හා උසස් විදුහල්පතිත්ව වැඩසටහන්** (Basic and Advanced Principalship Programmes) දෙකක් ආරම්භ කිරීමට
3. ඉහත (2) යටතේ ඉදිරිපත් කර තිබෙන වැඩසටහන් දෙකෙහි අරමුණු පැහැදිලි කරන්නේ කෙසේ ද?
   - පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව, ශ්‍රී ලාංකිය පාසල නඟා සිටුවීම සඳහා සකස් කරන ලද **වැඩසටහනක්** වුවත් මූලික හා උසස් විදුහල්පතිත්ව වැඩසටහන්, **ආරම්භක හා අඛණ්ඩ** (Initial and Continuing) ක්‍රමයට විදුහල්පතිවරුන් සංවර්ධනය සඳහා යොදා ගත හැකි **පාඨමාලා** දෙකක් බව
   - ඉහත පැහැදිලි කිරීමට අනුව විදුහල්පති චර්යා වෙනස් කිරීම සඳහා සකස් කර තිබෙන මූලික හා උසස් විදුහල්පතිත්ව වැඩසටහන්, පාසල් සිසුන්ගේ **චර්යා වෙනස්කිරීම සඳහා දායක වන** පාසල් විෂයමාලාවලට යම් සමානත්වයක් දක්වන බව
   - කෙසේ වෙතත්, මේ වැඩසටහන් දෙක ම **සැසිය 10**න් හඳුන්වාදීමට බලාපොරොත්තු වන **ප්‍රමිති පාදක පාසල් විෂයමාලා** ආශ්‍රිත කරුණු තහවුරු කර ගැනීම සඳහා බෙහෙවින් ම වැදගත් වන බව
4. ඉහත (2) යටතේ සඳහන් වැඩසටහන් සංවර්ධනය සඳහා මූලිකත්වය **ගත යුතු** ආයතන ඒ සඳහා දායක වන හේතු සමග ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද?

   වැඩසටහන 1: මෙය අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී තිබෙන නියාමන කායර්යක් නිසා **අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව**

වැඩසටහන 2: මෙය ජා.අ.ආ.ට පැවරී තිබෙන සංවර්ධන කාර්යයක් නිසා ජා.අ.ආ.යේ **අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා කළමනාකරණ පීඨය** (FELDM)

5. ජාතික මට්ටමේ අධ්‍යාපනික කටයුතු බෙදා දීම අවුල් ව ඇත්තේ කෙසේ ද? කිනම් හේතු යටතේ ද?
   - සියලු ම වැඩසටහන් (ශාස්ත්‍රීය/පරිපාලන) සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම, පරිපාලන වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කිරීම, සියලු ම වැඩසටහන් නියාමනය කරමින් එම වැඩසටහන් සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම වැනි **පරිපාලන කටයුතු** තමන්ට පැවරී ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශයට අමතක විම නිසා භූමිකා ගැටුම් (role conflicts) ඇති වීම,
   - අධ්‍යාපන ලේකම්ගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මක වන **ජා.අ.ආ. යේ සභාවට** (NIE Council) ජා.අ.ආ.න් ගිලිහෙන වැඩසටහන් පිළිබඳව ලේකම්තුමා දැනුවත් කර එම තත්ත්ව ක්‍රමවත් කර ගැනීමේ හැකියාව තිබුණත් අළුතින් පත් වන අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිගින් දිගට ම අනුගමනය කළ නිහඬ පිළිවෙත හමුවේ අවශ්‍ය කාරණා ඉටු නොවීම,
   - ඉහත සඳහන් ආකාරයට අඩාල වූ ශාස්ත්‍රීය කාරණා අතර විවිධ අධ්‍යාපන සේවාවලට බැඳෙන පිරිස්හි ආරම්භක හා අඛණ්ඩ සංවර්ධන අවශ්‍යතා (Initial and Continuing Development Needs) නිසි පරිදි ඉටු කර ගත නොහැකි වීම ප්‍රධාන තැනක් ගැනීම

6. ශ්‍රී ලාංකිය පාසල් අධ්‍යාපන කටයුතු නියාමනය සඳහා ප්‍රමිති පාදක වැඩසටහනක් හඳුන්වා දීමට දරන ලද උත්සාහයන්හි සාර්ථකතා මට්ටම් පහත වැටීමට හේතු වී ඇති සාධක කවරේ ද?
   - විදේශ උපදේශකයින් මත අනවශ්‍ය පමණට යැපීම නිසා පෙරදිග රටවල් ආරම්භයේ සිට භාවිත කළ ඇතැම් සංකල්ප උඩුයටිකුරු වීම (උදා: Concepts related to 3H & KAS, Management Vs. Administration, LT Vs. TL, and Evaluation Vs. Assessment)
   - ශ්‍රී ලාංකීය පාසල් අධ්‍යාපනයේ විකාශය පිළිබඳ මනා වැටහීමක් නොමැති දේශිය පිරිස් ව්‍යාපෘති සැලසුම්කරණය සඳහා යොදවා ගැනිම නිසා අවිචාරවත් (irrational) තේරීම් රැසක් සිදු ව තිබීම (උදා: සංකල්ප සිතියමක් මත පිහිටමින් තකර්ානුකූල ව හඳුනා ගැනීම අපොහොසත් ව තිබෙන **පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව**ට අදාළ **ඇගයීම් ක්ෂේත්‍ර**)
   - ඉහත සඳහන් හේතුව නිසා පාසලක නියාමනයට ලක් විය යුතු වැදගත් කාර්ය රැසක් ම මගහැරී ගොස් තිබීම (කාර්ය මණ්ඩල සංවර්ධනය, පරිපාලන කටයුතු, සැඟවුණු විෂයමාලාව වැනි) හා අපේක්ෂිත සමස්ත ප්‍රතිඵලය (සාර්ථක ජීවිතයක් සඳහා අවශ්‍ය වයර්‍ා වඩවා ගත් සිසුන්) වෙනුවට එම ප්‍රතිඵලයට දායක වන ශිෂ්‍ය සාධනය, විෂයමාලා කළමනාකරණය, නායකත්වය වැනි සාධක අනවශ්‍ය පමණට ඉස්මතු වී තිබීම.

7. ඇගයීම් ක්ෂේත්‍ර අටක් ඔස්සේ ක්‍රියාත්මක වන **පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව** (Assuring Quality of School Education) පිළිබඳ වැඩසටහන විචාරවත් කළ හැක්කේ කෙසේ ද?
   - සංකල්ප සිතියමක් ඔස්සේ ඇගයීම් ක්ෂේත්‍ර නිවැරදි ව හඳුනා ගැනීමෙන්
   - ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රය පිළිබඳ කාර්ය සාධනය නිවැරදි ව මිනුමට ලක් කළ හැකි **ප්‍රමිති, නිර්ණායක හා දර්ශක** තීරණය කිරීමෙන්
   - දර්ශකවලට ලකුණු ලබා දිම සඳහා දැනට පවතින හය ලක්ෂ්‍ය පරිමාණය වෙනුවට වඩාත් පහසු පරිමාණයක් (චතුර් ලක්ෂ්‍ය පරිමාණය) තෝරා ගැනීමෙන්
   - ඒ ඒ පාසල **මිනුමට ලක් කර තිබෙන** දර්ශක සංඛ්‍යාව වෙනුවට ඒ ඒ පාසල **මිනුමට ලක් කළ යුතු** දර්ශක සංඛ්‍යාව ඔස්සේ ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රයට අදාළ ලකුණු ප්‍රතිශත ගණනය කිරීමෙන්

- **ඒ ඒ පාසලට අදාළ දශර්ක මත පිහිටා** ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රය සඳහා ලකුණු ප්‍රතිශතය පළමුවත් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක දශර්කය (SEQI) දෙවනුවත් ගණනය කිරීමෙන්

8. **විධිමත් පාසල් විෂයමාලාව සාථර්ක ව ක්‍රියාත්මක වන / නොවන බව පෙන්වා දීම සඳහා ඔබ ප්‍රමිති, නිණර්ායක හා දශර්ක ගොඩනඟන්නේ කෙසේ ද?**

**ප්‍රමිතිය** ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් අභිමුඛ ක්‍රමපිළිවෙත් අනුගමනය කරමින් 21 වන සියවසේ අධ්‍යාපනය තහවුරු කරන ඉගෙනුම් ක්‍රියාවලියක ගුරුවරයා සිසුන් නිරත කරයි.

**නිණර්ායක හා දශර්ක**

1. ගුරුවරයා පසුබසිමින් ඉගෙනුම් ක්‍රියාවලියේ ප්‍රමුඛත්වය ගැනීමේ අවස්ථාව සිසුන්ට ලබා දී තිබේ.
   - තමන් මැදිහත් වෙමින් දැනුම ගොඩ නඟා ගැනීමට සිසුන් යොමු ව ඇත.
   - තම කණ්ඩායමේ සහෘදයින් සමග පළමුවත් **(ගවේෂණ අවස්ථාව)** අනෙක් කණ්ඩායම්වල සහෘදයින් සමග දෙවනුවත් **(විස්තාරණ අවස්ථාව)** සාකච්ඡා කරමින් තමා ගොඩ නඟා ගත් දැනුම සංවධර්නය සඳහා සිසුහු කටයුතු කරති. (5E ආකෘතිය, පෙරලුණ පන්තිකාමරය (Flipped Classroom, Inverted Classroom) වැනි වාතාවරණ යටතේ)
2. නිපුණතා සංවධර්නය සඳහා දැනුමෙන් ඔබ්බට යන සිසුන්ට ආකල්ප හා කුසලතා සංවධර්නය සඳහා ද ඉඩ ලැබෙයි.
   - සිසුහු ඉගෙනගන්නා දේ අගය කරති.
   - අගය කරන දේ අත්හදා බලති.
3. සිසුන් කුඩා කණ්ඩායම් ලෙස ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ඉගෙනීම සිදු කරයි.
   - සෑම කණ්ඩායමක් සඳහා ම නායකයෙකු පත් ව ඇත.
   - කුඩා කණ්ඩායම් ලෙස ඉගෙනගන්නා සිසුන්ට පවරන ලද කණ්ඩායම් වගකිම් හැරුණ විට පුද්ගල වගකිම් ද ඇත.
   - කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළ දී ඉහත සඳහන් වගකිම් දෙවගර්ය ම ඉටු කර ගැනිමට සිසුහු වගබලා ගනිති.
4. සිසුන් ඉගෙනීම සිදු කරන කාලය පුරා ගුරුවරයා **තක්සේරු භූමිකාවක** (Assessment Role of the Teacher) නිරත වෙයි.
   - ගුරුවරයා කණ්ඩායම් අතර ගැවසෙයි.
   - සිසුන් කරන කියන දේ සමීප ව නිරීක්ෂණය කරයි.
   - ඉගෙනගන්නා සිසුන්ට ප්‍රතිපෝෂණ (feedback) හා ඉදිරිපෝෂණ (feedforward) ලබා දෙයි.
5. කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කිරීමටත් (විවරණය), වැඩිදියුණු කිරීමටත් (විස්තාරණය) කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වූ සිසුන්ට අවස්ථාව ඇත.
   - තමන්ට පවරන ලද කොටස ආශ්‍රිත අනාවරණ ඉදිරිපත් කිරීමට සෑම සිසුවෙකු ම සූදානම් ව ඇත.
   - අවස්ථාව ලැබෙන කල සිසුහු තම අනාවරණ නොපැකිල ව පන්තියට ඉදිරිපත් කරති.
   - සහෘදයින් නඟන ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් අනාවරණ වැඩිදියුණු කරති.

6. සිසුන් විවරණයේ හා විස්තාරණයේ යෙදෙන විට ගුරුවරයා කාර්ය රැසක් සිදු කරයි.
    - විවරණයේ හා විස්තාරණයේ යෙදෙන සිසුන්ට ගුරුවරයා සවන් දෙයි.
    - සිසුන් ඉදිරිපත් කරන අදහස් වැඩිදියුණු කරමින්, සුදුසු අනුපිළිවෙලක් යටතේ ලැල්ලේ නිවැරදි ව සටහන් කරයි.
7. ක්‍රියාකාරකම සාර්ථක ව නිම කිරීමට ගුරුවරයා වගබලා ගනියි.
    - කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වල සාර්ථක/අසාර්ථක ලක්ෂණ පෙන්වා දෙයි.
    - ලැල්ලේ ගොඩනගන ලද සටහන අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට උපදෙස් දෙයි.
    - උගත් දේ තහවුරු කිරීම සඳහා සිසුන්ට ගෙදර වැඩ පැවරුමක් ලබා දෙයි.

<u>සාර්ථක ඉගෙනුමක් සඳහා යොදා ගෙන තිබෙන ප්‍රමිති පාදක විෂයමාලා</u>

1. සිසුන් වෙනුවෙන් සකස් කරන පාසල් විෂයමාලා හැරුණ විට සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය (System of General Education) සකස් කරන වෙනත් විෂයමාලා තිබේ ද? ඒ මොනවා ද?
    - ගුරු සංවර්ධනය (Teacher Development) සඳහා සකස් කරන විෂයමාලා
    - කළමනාකරණ සංවර්ධනය (Management Development) සඳහා සකස් කරන විෂයමාලා

2. ගුරු **පුහුණුව** (Teacher Training) / කළමනාකරණ **පුහුණුව** (Management Training) ලෙස ආරම්භ වූ පද කාලයත් සමග විකාශය වී ඇත්තේ කෙසේ ද?
    - දෙවන ලෝක යුද්ධය (1939 -1945) අවසන් වන විට **පුහුණුව** යන පදය, **අධ්‍යාපනය** (Teacher / Management Education) ලෙස වෙනස් වීම
    - 21 වන ශත වර්ෂයේ ආරම්භයත් සමග **අධ්‍යාපනය** යන පදය, **සංවර්ධනය** (Teacher / Management Development) ලෙස වෙනස් වීම
    - මේ අනුව පුහුණුව (Training) අධ්‍යාපනය (Education) ලෙසටත් අධ්‍යාපනය, සංවර්ධනය (Development) ලෙසටත් කලයත් සමග වෙනස්වීම

3. විදුහල්පතිත්ව පාඨමාලා (මූලික හා උසස්), අරමුණු තීරණය කිරීමටත් එම අරමුණු සාක්ෂාත් වූ මට්ටම් හඳුනා ගැනීමටත් කටයුතු කර ඇත්තේ කෙසේ ද?
    - පහත සඳහන් ආකාරයට **නිපුණතා වසම් (Competency Domains)** හතරක් හඳුනාගැනීම

      1.ගුණාත්මක පාසල් පාලනය (Quality School Governance)

      2.ධනාත්මක පාසල් පරිසරය (Positive School Environment)

      3.සඵලදායි පාසල් **කළමනාකරණය** (Effective School Management)

      **4.ගුණාත්මක ඉගෙනුම් පල (Quality Learning Outcomes)**

    - ඒ ඒ නිපුණතා වසම යටතේ **නිපුණතා ක්ෂේත්‍ර (Competency Areas)** හතර බැගින් හඳුනාගැනීම
    - ඒ ඒ නිපුණතා ක්ෂේත්‍රය යටතේ **නිපුණතා ප්‍රමිති (Competency Standards)** හතර බැගින් හඳුනාගැනීම
    - ඒ ඒ ප්‍රමිතිය යටතේ **චර්යාත්මක හා භෞතික දර්ශක (Behavioural and Physical Indicators)** හතර බැගින් හඳුනාගැනීම

**නිපුණතා වසම** 4 (Competency Domain 4): ගුණාත්මක ඉගෙනුම් පල

**නිපුණතා ක්ෂේත්‍ර** (Competency Areas 4.1 to 4.4)

4.1 විෂයමාලා ක්‍රියාත්මක කිරීම හා **නියාමනය** (Curriculum Implementation and Monitoring) - සකස් කරන ලද විෂයමාලා මනා නියාමනයක් යටතේ සාථර්ක ව ක්‍රියාත්මක කිරීම **විෂයමාලා කළමනාකරණයයි.**

4.2 ඉගැන්වීම හා ඉගෙනුම - ඉගෙනුම හා ඉගැන්වීම (Learning and Teaching)

4.3 තක්සේරුකරණය හා ඇගයීම - තක්සේරුව හා ඇගයීම (Evaluation for Learning and Evaluation of Learning)

4.4 ගුරු වෘත්තීය සංවධර්නය (Teacher Professional Development)

**නිපුණතා ප්‍රමිති** (Competency Standards) ඉගෙනුම හා ඉගැන්වීම හා සම්බන්ධ **4.2 නිපුණතා ක්ෂේත්‍රය සඳහා**

4.2.1 ගුණාත්මක **ශික්ෂණවිද්‍යාව** (Pedagogy) පාසල පුරා ප්‍රවධර්නය කළ හැකි **සඵලදායි පරිසර ගොඩනැඟීම** සඳහා පාසල් ප්‍රජාව උනන්දු කරයි. (Pedagogy Vs. Andragogy)

4.2.2 සියලු ම ගුරුවරුන් **සඵලදායි ඉගෙනුම්-ඉගැන්වීම් සැලසුම්** සකස් කර ක්‍රියාවට නංවන බව තහවුරු කිරීම සඳහා නියාමන කටයුතු මෙහෙයවයි.

4.2.3 සියලු ම පන්තිකාමරවල **ශිෂ්‍ය කේන්ද්‍රීය ශික්ෂණවිද්‍යාව** ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කරමින් එසේ සිදු වන බව තහවුරු කරයි.

4.2.4 සිසුන් කෙරෙහි සැලකිලිමත් **(caring),** සිසුන්ට සහාය වන **(supporting),** ශක්තිමත් **(strong) ගුරු සිසු සම්බන්ධතා** උනන්දු කරමින් එම සබඳතා පාසල පුරා ප්‍රවධර්නය කරයි.

නිපුණතා ප්‍රමිති සාක්ෂාත් වූ මට්ටම් සොයා බැලීම සඳහා යොදා ගන්නා **චයර්ාත්මක හා භෞතික දශර්ක (Behavioural and Physical Indicators)**

නිපුණතා ප්‍රමිතිය 4.2.1: ගුණාත්මක ශික්ෂණවිද්‍යාව (Pedagogy) පාසල පුරා ප්‍රවධර්නය කළ හැකි **සඵලදායි පරිසර ගොඩනැඟීම** සඳහා පාසල් ප්‍රජාව උනන්දු කරයි. (Pedagogy Vs. Andragogy)

**චයර්ාත්මක හා භෞතික දශර්ක**

(අ) ඉගෙනුම සඳහා ගත කරන කාලය (time on task) උපරිම කර ගැනීමේ අරමුණෙන් ඉගෙනුම් පරිසර කළමනාකරණය සඳහා ගුරුවරුන් යොමු කර ඇත.

(ආ) පන්ති කාමර වාතාවරණ තුළ ද පාසල පුරා ද විවිධත්වයෙන් යුතු සඵලදායි ඉගෙනුම් පරිසර පවතී.

(ඇ) පන්තිකාමර තුළ මෙන් ම ඉන් පරිබාහිරව ද ඉගෙනීම සඳහා සිසුන්ට අවස්ථාව සපයා ඇත.

(ඈ) සියලුම ඉගෙනුම් මධ්‍යස්ථානවලට (විද්‍යාගාර, ගණිතාගාර, තාක්ෂණාගාර, සම්පත්ගාර, පුස්තකාල) ප්‍රවේශ වන ස්ථානයන්හි කාලසටහන් ප්‍රදශර්නය කරමින් පාසල සතු අධ්‍යාපනික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලැබීම සඳහා ගුරුවරුන්ට අවස්ථාව සපයා ඇත.

නිපුණතා ප්‍රමිතිය 4.2.4: සිසුන් කෙරෙහි සැලකිලිමත් **(caring),** සිසුන්ට සහාය වන **(supporting),** ශක්තිමත් **(strong) ගුරු සිසු සම්බන්ධතා** උනන්දු කරමින් එම සබඳතා පාසල පුරා ප්‍රවධර්නය කරයි.

**චයර්ාත්මක හා භෞතික දශර්ක**

(අ) හැකි සෑම අවස්ථාවක ම සිසුන්ට ප්‍රශංසා ලබා දෙමින් සිසුන් දිරිමත් කරයි.

(ආ) දෛනික පාසල් පැමිණීම දුවර්ල සිසුන් කෙරෙහි විශේෂ අවධානය දක්වමින් ඒ අය පාසලින් ගිලිහීම වළක්වා ගැනිම සඳහා ගුරුවරුන් පෞද්ගලික ව වග වෙයි (Accountable).

(ඇ) සිසුන්ගේ ආරක්ෂාව කෙරෙහි ගුරුවරුන් සැබෑ උනන්දුවක් හා සැලකිල්ලක් දක්වයි.

(ඈ) පාසල් ඒම තමන්ට ප්‍රිය කායර්යක් බව සිසුන් ප්‍රකාශ කරනු නිතර ඇසෙන්නට ලැබෙයි.

විදුහල්පති සංවධර්න වැඩසටහන්වලදී ප්‍රමිතිපාදක ආකෘතිය ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?

- ඒ ඒ ප්‍රමිතිය යටතේ හඳුනාගෙන තිබෙන **වයර්ාත්මක දශර්ක** (නව විෂයමාලා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික සූදානම සියලු ම ගුරුවරුන් ලබා ඇත) හා **භෞතික දශර්ක** (සිසුන් අතර බෙදා හැරීම සඳහා ප්‍රමාණවත් පෙළපොත් සංඛ්‍යාවක් පාසලට ලැබී ඇත) හතර සාක්ෂාත් ව ඇති ආකාරය, ප්‍රදශර්නය නොවේ (Not Evident) / සංවධර්නය වෙමින් පවතී (Developing) / ප්‍රදශර්නය වේ (Evident) යන මට්ටම් යටතේ හඳුනා ගෙන 00, 01, 02 ලෙස ලකුණු ප්‍රධානය

- ඉහත ප්‍රතිඵලය යොදා ගනිමින් ඒ ඒ **නිපුණතා ප්‍රමිතිය** සාක්ෂාත් ව ඇති මට්ටම ආරම්භක අවස්ථාව (Beginning Competence – 00-02), සංවධර්නය වෙමින් පවතින අවස්ථාව (Developing Competence – 03-04), ඉහළ මට්ටමකට සංවධර්නය වී ඇති අවස්ථාව (Advanced Competence – 05-06), විශිෂ්ටත්වයට එළඹ ඇති අවස්ථාව (Expert Competence – 07-08) ලෙස හඳුනා ගැනීම

4. විදුහල්පතිත්ව පාඨමාලා සඳහා තෝරාගෙන තිබෙන ප්‍රමිතිය 4.2.4 ට අදාළ ව නිපුණතා ප්‍රමිතිය (Competency Standard) හඳුනා ගැනිම සඳහා සුදුසු ක්‍රමයක් හඳුන්වා දෙන්නේ කෙසේ ද?
   - ප්‍රමිතිය 4.2.4 යටතේ වයර්ාත්මක හා භෞතික දශර්ක පෙළ ගැස්වීම
   - එම දශර්ක ප්‍රදශර්නය වන මට්ටම් හඳුනාගෙන 0, 1, 2 ආදි වශයෙන් ලකුණු ප්‍රධානය කිරීම
   - පහත වගුව පෙන්වා දෙන ආකාරයට නිපුණතා ප්‍රමිතිය ගණනය කිරීම

| **ප්‍රමිතිය 4.2.4: සිසුන් කෙරෙහි සැලකිලිමත් (caring), සිසුන්ට සහාය වන (supporting), ශක්තිමත් (strong) ගුරු සිසු සම්බන්ධතා උනන්දු කරමින් එම සබඳතා පාසල පුරා ප්‍රවධර්නය කරයි.** | | | |
|---|---|---|---|
| වයර්ාත්මක හා භෞතික දශර්ක | ප්‍රදශර්නය නොවේ | සංවධර්නය වේ | ප්‍රදශර්නය වේ |
| (අ) හැකි සෑම අවස්ථාවක ම සිසුන්ට ප්‍රශංසා ලබා දෙමින් සිසුන් දිරිමත් කිරීම ගුරු කායර් භාරයේ කොටසක් බවට පත් ව තිබේ. | | | |
| (ආ)දෛනික පාසල් පැමිණීම දුවර්ල සිසුන් කෙරෙහි විශේෂ අවධානය දක්වමින් ඒ අය පාසලින් ගිලිහීම වළක්වා ගැනිම සඳහා ගුරුවරු පෞද්ගලික ව වග වෙති. | | | |
| (ඇ)සිසුන්ගේ ආරක්ෂාව කෙරෙහි ගුරුවරු සැබෑ උනන්දුවක් හා සැලකිල්ලක් දක්වති. | | | |
| (ඈ)පාසල් ඒම තමන්ට ප්‍රිය කායර්යක් බව සිසුන් ප්‍රකාශ කරනු නිතර ඇසෙන්නට ලැබෙයි. | | | |

| නිපුණතා ප්‍රමිතිය Competency Standard | ආරම්භක නිපුණතාව Beginning Competence (00-02) | සංවර්ධනය වන නිපුණතාව Developing Competence (03-04) | ඉහළ නිපුණතාව Advanced Competence (05-06) | විශිෂ්ට නිපුණතාව Expert Competence (07-08) |
|---|---|---|---|---|
| | | | | |

5. නිපුණතා ක්ෂේත්‍ර 4.1, 4.2 හා 4.3 සඳහා ද ලකුණු ප්‍රධානය ඔබේ අවශ්‍යතාව යයි සිතා එම ක්ෂේත්‍ර පිළිබඳව ඔබ කටයුතු කරන ආකාරය පෙන්වා දීමට සුදුසු වගු ගොඩ නඟන්න.

**Productive School**

